CPA
Centre for Policy Alternatives
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

# 2023 ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත පිළිබඳ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සිදු කරනු ප්‍රකාශනය.

2023 මාර්තු 22 වැනි දිනැති ගැසට් පත්‍රයේ 'ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පතක්' රජය විසින් ප්‍රකාශයට පත් කර ඇති බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ නිරීක්ෂණයට ලක් විය. දැනට පවතින ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) අහෝසි කර නව ත්‍රස්ත විරෝධී පනතක් හඳුන්වා දීම මෙම පනත් කෙටුම්පතේ අරමුණ වී තිබේ. මෙම නීතිමය ප්‍රතිසංස්කරණ අධ්‍යයනය කළ යුතු වන්නේ මෙතෙක් පැවති ජනාධිපති පාලන තන්ත්‍රයන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සහ හදිසි අවස්ථා බලතල අවභාවිතා කිරීම පිළිබඳ අඛණ්ඩ ඉතිහාසය මෙන් ම, සීමිත සංවරණ සහ තුලනයන්ට පමණක් යටත් වූ පුළුල් බලතල වත්මන් කෙටුම්පත මඟින් විධායකයට ලබාදී තිබීම යන සන්දර්භය තුළ හිඳිමිණි. විශේෂයෙන්ම ශ්‍රී ලංකාව තුළ වධහිංසා පැමිණවීම සහ දණ්ඩමුක්තිය මුල්කර ගත් සංස්කෘතියක් යටතේ සුළු ජාතීන්, විවේචකයන් සහ විරෝධතාකරුවන් ඉලක්ක කිරීමට බලධාරීන් ආරක්ෂක නීති භාවිතා කරන පසුබිම තුළ, වත්මන් පනත් කෙටුම්පතට දැඩි අවධානයක් යොමු විය යුතු බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සඳහන් කරයි. ත්‍රස්ත විරෝධය මුවාවෙන් පුද්ගලයන්ට අමානුෂික ලෙස සලකන සංස්කෘතිය වෙනස් කිරීමට සැබෑ දේශපාලන කැමැත්තක් නොමැති තත්වයක් යටතේ නීති ප්‍රතිසංස්කරණයක් තුළින් පමණක් කල් පවත්නා වෙනසක් අත් කරගත නොහැකි බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නැවතත් අවධාරණය කරයි.

යෝජිත ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත පිළිබඳ මෙම මූලික අදහස් දැක්වීමේදී, 2018 වසරේ දී ගැසට්පත්‍රයේ එළ කරන ලදුව එහෙත් කිසි දිනෙක පාර්ලිමේන්තුවෙන් සම්මත නො වූ ප්‍රතිත්‍රස්ත පනත් කෙටුම්පත සහ වත්මන් පනත් කෙටුම්පත අතර සැලකිය යුතු සමානකම් පවතින බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ නිරීක්ෂණයට ලක්ව තිබේ. කෙසේ වෙතත්, නව පනත් කෙටුම්පත තුළ 2018 පනත් කෙටුම්පතේ අන්තර්ගත නොවූ වරදවල් කිහිපයක් අඩංගු වන අතර, ඒවායින් සමහරක් අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස පිළිබඳ බරපතල තත්වයන් ඉස්මතු කරන අතර, විසම්මුතිය සහ විවේචන මර්දනය කිරීමට රජයට අමතර මෙවලමක් ලබා දීමේ ඉඩකඩක් නිර්මාණය කරයි. මෙම පනත් කෙටුම්පතේ එක් සාධනීය අංගයක් නම්, පොලිස් නිලධාරියෙකුට රැඳවුම් භාරයේ සිටින සැකකරුවන් විසින් කරන ලද පාපොච්චාරණ තවදුරටත් සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කළ නොහැකි වීමයි. මෙය සාමාන්‍ය නීතියේ පොදු මූලධර්මයක් වන අතර, ඒ සඳහා ව්‍යතිරේකයක් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) මඟින් හඳුන්වා දී තිබිණි. මේ හේතුවෙන් අත්අඩංගුවේ දී කරන ලද පාපොච්චාරණ පිළිගැනුණු අතර එය පද්ධතිමය අසාධාරණයන්ට තුඩු දෙන 'බලහත්කාර පාපොච්චාරණ' සංස්කෘතියක් නිර්මාණය කළේය.

කෙසේ වෙතත්, ප්‍රධාන කරුණක් තවමත් ඉතිරිව පවතී. එනම් රැඳවුම් නියෝග නිකුත් කිරීමයි. මෙම පනත් කෙටුම්පත මගින් රැඳවුම් නියෝග නිකුත් කිරීමේ බලය නියෝජ්‍ය පොලිස්පතිවරුන් වෙත පවරා ඇත, එය ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) යටතේ ආරක්ෂක අමාත්‍යවරයා සතු බලයකි. කෙසේ වෙතත්, 2018 ප්‍රතිත්‍රස්ත පනත් කෙටුම්පත මගින් නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු විසින් නිකුත් කරන මූලික රැඳවුම් නියෝගය සති 2ක් දක්වා දීර්ඝ කිරීමට අවසර දී තිබිණි. එහෙත් නව පනත් කෙටුම්පත ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) යටතේ පවත්නා යාන්ත්‍රණයට වඩාත් සමාන වන අතර, රැඳවුම් නියෝගයක් මාස 3ක් දක්වා දීර්ඝ කිරීමට ඉඩ සලසයි. මෙය දැඩි අවධානයට ලක්විය යුතු කරුණක් වන්නේ කිසිදු හරයාත්මක චෝදනාවක් නොමැතිව පවා මෙම පනත් කෙටුම්පත යටතේ චූදිතයන්ගේ නිදහස යටපත් කිරීමට එය හේතු විය හැකි බැවිනි. ආරම්භක මාස 3 න් ඔබ්බට, වසරක් දක්වා රැඳවුම් නියෝග දීර්ඝ කළ හැකි නමුත්, මහේස්ත්‍රාත්වරයෙකු විසින් දීර්ඝ කිරීම අනුමත කළ යුතුය.

පනත් කෙටුම්පත යටතේ සංවිධානවලට එරෙහිව 'තහනම් නියෝග' පැනවීමේ බලය ද ජනාධිපතිවරයාට පවරා ඇත. ත්‍රස්තවාදී වරදක් සම්බන්ධයෙන් චෝදනා එල්ල වූ සංවිධානවලට එරෙහිව මෙම නියෝග නිකුත් කිරීමට නියමිත නමුදු, ශ්‍රී ලංකාවේ හෝ වෙනත් රටක ජාතික ආරක්ෂාවට අගතියක් වන අයුරින් සංවිධානයක් ක්‍රියා කරන බවට විශ්වාස කිරීමට ජනාධිපතිවරයාට 'සාධාරණ හේතු' පවතින අවස්ථාවක ද මෙම නියෝග නිකුත් කල හැක. මෙම පුළුල් බලතල නීත්‍යානුකූල පදනමකින් රට තුළ පැන නඟින විසම්මුතීන් මැඩපැවැත්වීමට භාවිත කළ හැකි අතර, මර්දනයට සම්බන්ධ මෑත කාලීන රටාවන් සලකා බලන කල එය බොහෝ දුරට සිදු විය හැක්කකි.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ (PTA) මෙන් ම මෙම පනත් කෙටුම්පත යටතේ ද ජනාධිපතිවරයාට රෙගුලාසි සම්පාදනය සම්බන්ධව පුළුල් බලතල ලබා දී තිබේ. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සම්පාදිත රෙගුලාසි මර්ධන මෙවලමක් ලෙස අවභාවිතා කිරීමට ඇති හැකියාව සම්බන්ධව කරුණු ඉස්මතු කිරීමටත් නඩු පැවරීමටත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වසර ගණනක් මුළුල්ලේ කටයුතු කර ඇත. පුරවැසියාගේ නිදහස ආරක්ෂා කිරීම පිණිස මෙසේ රෙගුලාසි සම්පාදනය කිරීමට ඇති බලතල සීමා කළ යුතුය. පුනරුත්ථාපන වැඩසටහන් අතරතුර සිදු වූ අපයෝජනයන් සහ මූලික අයිතිවාසිකම් උල්ලංඝණයන් පිළිබඳ ඉතිහාසය සලකා බලමින් නීතිපතිවරයා විසින් අපරාධ නඩු පැවරීම කල්දැමීමට/අත්හිටුවීමට නිර්දේශ කර ඇති පුද්ගලයන් සඳහා පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය රෙගුලාසි නිකුත් කිරීමට පනත් කෙටුම්පත මගින් ජනාධිපතිවරයාට බලතල ලබා දී තිබීම ගැන විශේෂ අවධානය යොමු කළ යුතුය. වසර 2021 දී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) යටතේ ප්‍රකාශයට පත් කරන ලද එවැනිම රෙගුලාසි මාලාවක් අභියෝගයට ලක් කරමින් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කළ අතර, ශ්‍රේෂ්ඨාධිකරණය එකී රෙගුලාසි ක්‍රියාත්මක කිරීම අත්හිටුවන ලදී.

පනත් කෙටුම්පතේ 'ත්‍රස්තවාදයේ වරද' පිළිබඳව දී තිබෙන නිර්වචනය සීමාව ඉක්මවා පුළුල් වන අතර 'භෞමික අඛණ්ඩතාව උල්ලංඝණය කිරීම හෝ ශ්‍රී ලංකාවේ හෝ වෙනත් ස්වෛරී රාජ්‍යයක ස්වෛරීත්වය උල්ලංඝණය කිරීම' වැනි නොපැහැදිලි මෙන් ම නිර්වචනය නොකළ අංග අඩංගු බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පෙන්වා දෙයි. එවැනි යෙදුම් භාවිතය ශ්‍රී ලංකාවේ මර්දනය සහ ත්‍රස්ත-විරෝධී නීති අනිසි ලෙස භාවිතා කිරීම පිළිබඳ මතභේදාත්මක ඉතිහාසය ඇසුරෙන් සැලකිල්ලට ගත යුතු ය. එපමණක් නොව, ත්‍රස්තවාදයේ වරද පිළිබඳ මෙම නිර්වචනය නියතාර්ථයයෙන් තොරවන අතර අවශ්‍යතාවය, සමානුපාතිකත්වය සහ නීත්‍යානුකූලභාවය යන මූලධර්මවලට අනුගත නොවන්නකි.

පනත් කෙටුම්පත ප්‍රකාශයට පත් කිරීමේ ක්‍රියාවලිය හා බැඳුනු රහස්‍යභාවය සහ එය ප්‍රකාශයට පත් කරන ලද අවස්ථාව සම්බන්ධයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සැලකිළිමත් වන අතර, එය තීරණාත්මක ගැටලුවක් සම්බන්ධයෙන් මහජනතාව සමඟ අවංකව සම්බන්ධ වීමට උනන්දුවක් නොමැති බව පෙන්නුම් කරයි. මෙම මූලික කරුණු මතු කිරීම තුලින් අපේක්ෂා කරන්නේ බලධාරීන් සහ නීති

සම්පාදකයන් සමඟ සාධනීය ලෙස සම්බන්ධ වීම සහ එවැනි නීතියක් ශ්‍රී ලංකාවට අවශ්‍යද යන්න පිළිබඳ සංවාදයක් ඇති කිරීමයි. පනත් කෙටුම්පතේ වගන්ති පිළිබඳ වඩාත් සවිස්තරාත්මක විවරණයක් ඉදිරියේදී සිදුකිරීමට නියමිතයි.

ත්‍රස්ත විරෝධී පනත පිළිබඳ වර්තමාන යෝජනාව සලකා බැලිය යුත්තේ ත්‍රස්ත නීති අවභාවිතාව හා බැඳුණු ශ්‍රී ලාංකේය උරුමය සහ එවැනි අවභාවිතාවන්ට පහසුකම් සැලසෙන පරිදි ස්ථාපිත කර ඇති ක්‍රමවේදයන් සලකා බලමිනි. ශ්‍රී ලංකාව ප්‍රකෘතිමත් භාවයේ සහ නැවත ගොඩනැගීමේ මාවත ඔස්සේ ඉදිරියට යමින් සිටින මොහොතක, අවභාවිතාව සහ දණ්ඩමුක්තිය පිළිබඳ පුනරාවර්තන භාවිතයන් ආමන්ත්‍රණය කිරීමට සහ ශ්‍රී ලංකාවේ නීතියේ ආධිපත්‍යය සහ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීමට අව්‍යාජ ක්‍රියාමාර්ග ගැනීම ඉතා වැදගත් වේ. අවභාවිතාව සම්බන්ධ ඉතිහාසය සැලකිල්ලට ගැනීමේ දී මහජන විශ්වාසය ගොඩනැගීම පිණිස බොහෝ දුරක් ගමන් කිරීමට ඇති බව නීති සම්පාදකයින් වටහා ගත යුතු අතර, අවශ්‍ය සියලු සංවරණ සහ තුලනයන් ක්‍රියාත්මක කිරීමෙන් එම විශ්වාසය නැවත දිනා ගැනීම රාජ්‍ය සතු වගකීමකි.